# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2073/19 - 2018 මැයි මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2018.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (1) වැනි අනුව්‍යවස්ථාව යටතේ මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මා විසින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකු වශයෙන් පත් කරන ලද ජාතික සමගිය හා සහජීවනය රාජ්‍ය අමාත්‍යවරයා හට, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි අනු ව්‍යවස්ථාව ප්‍රකාරව පවරනු ලබන අමාත්‍යාංශය ද, එහි විෂයයන් හා කාර්යයන් ද නිශ්චය කර ඇති හෙයින්, 2018 මැයි මස 11 වැනි දින සිට මෙහි පහත උපලේඛනයේ සඳහන් පරිදි එකී අමාත්‍යාංශයේ විෂයයන් හා කාර්යයන් ද, එකී අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතන ද පවත්නා බව මවිසින් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 මැයි මස 28 වැනි දින,
කොළඹ 01,
ජනාධිපති කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

**ජාතික සමගිය හා සහජීවනය රාජ්‍ය අමාත්‍ය**

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තව්‍යයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 1. ශ්‍රී ලංකාවේ අනන්‍යතාවය ප්‍රවර්ධනය සඳහා ජාතික සමගිය හා සහජීවනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ සහිතව ප්‍රතිපත්ති සකස් කිරීම. | 1. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය. (අමාත්‍යාතංශයේ මෙහෙවර ක්‍රියාත්මක කිරීමේ ආයතනයකි)<br>2. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය. | • අතුරුදහන් වු තැනැත්තන් පිළිබඳ කාර්යාලය. (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනත (2016 අංක 14). |


1A - G 27757 — 367 (2018/05)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය** *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව*<br>*කාර්යයන් හා කර්තවයන්* | *II වැනි තීරුව*<br>*දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව*<br>*ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 2. කල්පවත්නා සාමයක් ගොඩනැගීමට ජාතික සමගිය හා සහජීවනය සඳහා අවශ්‍යවන්නා වූ ප්‍රතිපත්ති හා ක්‍රියාකාරකම් පිළිබඳ රජයේ බලධාරීන්ට උපදෙස් ලබා දීම.<br><br>3. සාමය ගොඩනැගීමේ ක්‍රියාවලියේ දී පැන නැගිය හැකි ගැටළු සම්බන්ධයෙන් රජයේ බලධාරීන්ට උපදෙස් ලබා දීම.<br><br>4. එවැනි ගැටළු සඳහා සුදුසු විසඳුම් සෙවීමට යෝජනා ඉදිරිපත් කිරීමේදී රජයේ බලධාරීන්ට උපදෙස් දීම.<br><br>5. සර්ව සහභාගීත්ව සමගි සම්පන්න සමාජයක් ගොඩනැංවීමටත්, සහජීවනය ප්‍රවර්ධනය කරලීම පිණිසත් වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය කිරීම.<br><br>6. ක්ෂේත්‍ර මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන අදාළ වැඩසටහන් හා ක්‍රියාකාරකම් අධීක්ෂණය හා ඇගයීම.<br><br>7. විවිධ ප්‍රජාවන් තුළ හා අතර ඇතිවිය හැකි මතබේද හා ගැටුම් සඳහා හේතු පාදක වන කරුණු විසඳීම සඳහා වන ක්‍රියා මාර්ග රජයට යෝජනා කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම, පසුවිපරම් කිරීම.<br><br>8. ප්‍රජාවන් තුළ හා අතර ගැටුම්කාරී අවස්ථා වන්ට තුඩුදිය හැකි දැඩි මතබේදකාරී අවස්ථාවන් හඳුනා ගැනීම සහ එවැනි අවස්ථාවන් සමනය කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම හා නිර්දේශයන් ඉදිරිපත් කිරීම.<br><br>9. ඉහත 1 යටතේ දක්වන ලද ප්‍රතිපත්ති හා අනුගත වෙමින් අධ්‍යාපනික, නීතිමය, දේශපාලනීමය, ආර්ථිකමය, සමාජමය හා සංස්කෘතිකමය විෂයයන් අළලා වැඩසටහන් සම්පාදය කිරීම, ක්‍රියාත්මක කිරීම හා පසු විපරම් කිරීම. | | • වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, මෙහි I හා II තීරුවල සඳහන් විෂයයන්ට අදළ අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්. |

**උපලේඛනය** (සම්බන්ධිතයි)

| *I වැනි තීරුව කාර්යයන් හා කර්තවයන්* | *II වැනි තීරුව දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා* | *III වැනි තීරුව ක්‍රියාත්මක කළ යුතු නීති* |
|---|---|---|
| 10. ජාතික සමගිය හා ප්‍රතිසන්ධානය සඳහා වන කාර්යාලය මගින් දියත් කරනු ලබන වැඩ සටහන් සම්බන්ධයෙන් අදහස් හා සහභාගීත්වය ලබා ගැනීම සඳහා, රජය, ව්‍යාපාරික ප්‍රජාව සහ රාජ්‍ය නොවන අංශ සමග සංවාද පවත්වා ගැනීම. | | |
| 11. උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන පරීක්ෂණ කොමිෂන් සභාවේ යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වූ විට මැදිහත් වීම. | | |
| 12. මුල්‍යමය ආධාර සහ විශේෂඥතාවය ලබා ගනු පිණිස ජාත්‍යන්තර ප්‍රජාව සමග සම්බන්ධතා ගොඩ නැගීම. | | |
| 13. යෝග්‍ය ක්‍රමවේද යොදා ගනිමින් අවශ්‍ය වන්නේ නම් උක්ත වැඩසටහන් හා ව්‍යාපෘති සඳහා අරමුදල් සම්පාදනය කර ගැනීම. | | |
| 14. 2016 අංක 14 දරන අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) පනතට අදාළ සියලුම කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීම. | | |
| 15. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන්ට පැවරී ඇති අනිකුත් සියලුම විෂයයන්. | | |
| 16. II වැනි තීරුවෙහි දැක්වෙන ආයතනයන් අධීක්ෂණය කිරීම. | | |

06 - 619

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.